## 5. ශීර්ෂය 05 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය

---

### 5.1 විගණන විෂය පථය

---

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 06 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 5.3 විගණන නිරීක්ෂණය

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 5.4 සිට 5.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ)　**අයවැය විචලනය**

**--------------------**

(i)　වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.9,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii)　වැය විෂයයන් 04 කට රු.17,070,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.4,911,701 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.12,158,299 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් අදාල වැය විෂයයන් සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 41 සිට සියයට 94 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 5.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

**--------------------------------------**

### 5.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

**------------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 401 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කාර්යාලය විසින් පිලියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.4.2 අභ්‍යන්තර විගණනය

**----------------------**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

**------------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

## 5.5 වත්කම් කළමනාකරණය

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම වාර්තා 2013 අප්‍රේල් 02 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

## 5.6 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 231 (1) හා (2) | 25,725 | ගෙවීම් තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 257 | 36,701 | වවුචර සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 264 (1) | 253,292 | වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට ආදායකයාගෙන් ලදුපතක් ලබා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 1646 | | මෝටර් වාහනවල දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br>------------------------- | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | | පරිගණක හා පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | **ජාතික අයවැය චක්‍රලේඛ**<br>------------------------- | | |
| | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරණ චක්‍රලේඛයේ 1.1.3 - 1.1.7 දක්වා ඡේද | 1,300,936 | ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල කාලය තුලදී මාසික ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | **2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත** | 216,765 | රු.25000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තු අය කර නොතිබුණි. |

## 5.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

කාර්යාලය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

201 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව කල් බදු ලීසිං ක්‍රමය යටතේ ලබාගත හැකි වාහන වල අමාත්‍යාංශ ලේකම් හා සමාන තනතුරකට හිමි උපරිම මිල

මට්ටම් සීමාව රු.5,000,000 ක් වුවද එම සිමාව ඉක්මවා රු.6,750,000 කට (KR - 7399) වාහනයක් ලබාගෙන එය කාර්යාලයේ ජොෂ්ඨ නිති උපදේශක වරයාට ලබා දී තිබුණි.

## 5.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජොෂ්ඨ මට්ටම | 13 | 10 | 03 | - |
| (ආ) | තෘතියික මට්ටම | 07 | 06 | 01 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 29 | 21 | 08 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 28 | 24 | 04 | - |
| (ඉ) | වෙනත් (අනියම්, තාවකාලික පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 77 | 64 | 16 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 16 ක් පිරවිමට කටයුතු කර නොතිබුණි.